www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සින්ඩි ෂිහාන් ඩිමොක්‍රටික් පක්ෂයෙන් ඉවත්වීම ගැන නේෂන් පුවත්පත නිහඬව සිටින්නේ මන්ද?

## *පලමු වන කොටස*

**Why the *Nation* remains silent on Cindy Sheehan's departure from the Democratic Party - Part 1**

**ඩේවිඩ් වොල්ෂ් විසිනි**

**2007 ජුනි 18**

*මෙය කොටස් තුනකින් යුත් ලේඛනයක පලමු කොටසයි.*

තමන් ඩිමොක්‍රටික් පක්ෂයෙන් ඉවත්වන බවත් අනෙක් අයගෙන් ද එසේ කරන ලෙසට ඉල්ලා සිටින බවත් නිවේදනය කල සින්ඩි ෂිහාන්ගේ මැයි 26 දින නිවේදනය, එක්සත් ජනපදයේ වාම විරෝධතා කන්ඩායම් හා ඒවායේ ප්‍රකාශන ගනනාවක් විසින් යටපත් කිරීමේ කාරනය ජුනි 2 දින ලෝක සමාජවාදී වෙබ් අඩවිය සැලකිලිලට ගත්තා ය. (බලන්නඃ " ඩිමොක්‍රටික් පක්ෂයෙන් සින්ඩි ෂිහාන්ගේ ඉල්ලා අස්වීම ගැන එක්සත් ජනපදයේ යුද්ධයට එරෙහි විරෝධතා කන්ඩායමේ නිශ්ශබ්දතාවය")

ලෝසවෙඅ වාම ලිබරල් ප්‍රකාශනයක් වන නේෂන් සඟරාවට ද එහි වාර්තාකාර ජෝන් නිකොල්ස් වෙත ද අවධානය යොමු කලා ය. දැනට සති ගනනාවක් ගත වී ඇත ද නිකොල්ස් ද ඇතුලු සඟරාවේ ප්‍රමුඛ තක්කඩියන්, ඩිමොක්‍රටිකයන් සමග ෂිහාන්ගේ භේදය තවමත් සාකච්ඡාවට ගෙන නැත.

2004 බැග්ඩෑඩ්හි දී මියගිය 24 වියැති සොල්දාදුවෙකුගේ මව වන ෂිහාන්, 2005 අගෝස්තුවේ දී ජෝර්ජ් බුෂ්ගේ ටෙක්සාස්හි ක්‍රෝෆර්ඩ් ගොවිපල කරා ම ඇගේ විරෝධතාව ගෙන ගිය තැන් සිට ඇය ඇමරිකානු දේශපාලන ජීවිතය තුල නැගී සිට තිබේ.

යුද වියදම් සඳහා තවත් ඩොලර් බිලියන 100ක් අනුමත කිරීමෙන් පසුව, කොන්ග්‍රසයේ ඩිමොක්‍රටිකයන් වෙත මැයි 26 දින යොමු කල ඇගේ ලිපිය ප්‍රබල එකක් විය. "ඔබ සිතන්නේ ඔහුට (බුෂ්ට) තවත් මුදල් ලබාදීම දේශපාලනිකව වාසිදායක බවයි. එහෙත් එය සදාචාරාත්මකව පිලිකුල් සහගත වන අතර ඉරාක වාඩිලෑම පවතින සෑම තත්පරයක ම ඔබ සියල්ලන්ගේ අත්වල තවත් ලේ තැවරෙනු ඇතැ"යි ඇය සඳහන් කලා ය.

ඇගේ ප්‍රකාශය තුල ෂිහාන් ඩිමොක්‍රටිකයන්ගේ "නොතැකීම" හෙලා දුටුවා ය. ඉරාකයේ "තල්ලුව" පිලිබඳ ප්‍රගති වාර්තාව පලවීමට නියමිත එලඹෙන ශරත් සෘතුවේ "තත්වයට මුහුන දෙමු" "ඔබ පක්ෂයේ යුද විරෝධී කන්ඩායම රැවටිය හැකි යයි ඔබ සිතන තවත් රංගනයන්ගෙන් පසුව ඔබ ඔහුට (බුෂ්ට) තවත් මුදල් ලබා දෙනු ඇතැ"යි ඇය අනාවැකි පලකලාය. ඒ වනවිට තවත් සියගනනක් ඇමරිකානු සෙබලුන් මියගොස් සිටිනු ඇතැයි ඇය, සෙනෙට් සභික රිපබ්ලිකානු හැරී රීඩ්ට හා ඩිමොක්‍රටික් නායකත්වයේ නැන්සි පෙලෝසි හා අනෙක් අයට සිහිපත් කර දෙයි. "ඔබගේ දේශපාලන ගිජුකම වෙනුවෙන් තව තවත් ජීවිත විනාශ වනු ඇත."

"ඔබ රාත්‍රියේ නින්දට යන්නේ හෝ කන්නාඩියෙන් ඔබ දෙස ම බලන්නේ පවා කෙසේ ද? ගැටුමේ දෙපාර්ශ්වයේම හඬා වැලපෙන මවුවරුන්ට ඔබ පිටුපාන්නේ කෙසේ ද? ඔබ නිර්මානය කර තිබෙන දුක් වේදනාවන්ගෙන් ඔබ ගැලවෙන්නේ කෙසේ ද? එය ජෝර්ජ් බුෂ්ගේ යුද්ධය බවට පත්ව තිබේ. ඔබට එය ගෞරවාන්විතව අවසන් කල හැකිය. දැන් ඔබගේ වාරයයි" ඇය තව දුරටත් කියා සිටියා ය.

මේවා ප්‍රබල වචන ය

මැයි 30 දින ඇමී ගුඩ්මන්ගේ "ප්‍රජාතන්ත්‍රවාදය දැන්" ගුවන්විදුලි වැඩ සටහනට සහභාගි වෙමින් ෂිහාන් කියා සිටියේ "ශක්‍ය වූ තුන්වැනි පක්ෂයක් අපට ලබා ගත නොහැක්කේ නම් - සමහරුන් කියන්නේ දෙවැනි පක්ෂයක් - ඩිමොක්‍රටිකයන් හා රිපබ්ලිකානුවන් බෙහෙවින් සමාන බව ඔබ දන්නා අතර ඔවුන්ගේ සාක්කු මසා ඇත්තේ ද එකම මිනිසුන්ය. අපගේ නියෝජිත සමූහාන්ඩුව මියයමින් තිබෙන්නේ ජෝර්ජ් බුෂ් සියලු බලතල තමන් වෙත පවරාගෙන ඇති අතර කොන්ග්‍රසය ඔහුට එම බලතල ලබා දී තිබෙන තත්වයක් තුල ය. අපට සැබවින් ම මෙරට තුල විපක්ෂයක් අවශ්‍යය." යනුවෙනි.

ෂිහාන්ගේ ප්‍රකාශන පිලිබඳව වාම ලිබරල්වාදීන් දක්වන නිශ්ශබ්දතාවය අර්බුදයක් ඇඟවුම් කරයි. ඇයට එය අවංකව හා විවෘතව කිව හැකි වුවත් ඔවුන්ට නොහැකි ය.

අනවශ්‍ය තරම් ඇයට ප්‍රශංසා පිරිනමන අතර මෙම කොටස්වල ප්‍රතිචාරය වී ඇත්තේ ඩිමොක්‍රටික්

පක්ෂය පිලිබඳ ෂිහාන්ගේ හෙලාදැකීම බොහෝ කොට ම නොතකා හැරීම ය. මෙම උත්සාහයේ දී නිකොල්ස් පෙරමුන ගෙන ඇත. නේෂන්හි වෙබ් අඩවියේ ඔහු ලිපි දෙක් පලකර තිබේ. "සින්ඩි ෂිහාන් නිහඬවෙයි." මැයි 29 දිනත් "සින්ඩි ෂිහාන්ගේ සමුගැනීම" මැයි 31 දිනත් පලකල අතර සඟරාවේ ජූනි 17 දින සංස්කරනයෙහි ද පලවිය. ලිපි දෙකෙහි ම සඳහන් කලේ ෂිහාන්ගේ මැයි 28 දින ප්‍රකාශය යි. "වෛශ්‍ය වෘත්තියට ගෞරව වශයෙන් හොඳින් ඉවත්වීම" තුල ඇය යුද විරෝධී ව්‍යාපාරය තුල ඇගේ අත්දැකීම් පිලිබඳ යම් අප්‍රසාදයක් හා වෙහෙසට පත් වූ බවක් පල කරමින් ප්‍රකාශ කලේ ඇය සිය ක්‍රියාකාරකම්වලින් ඉවත්වන බවයි.

කුමන හෝ වෛෂයික මිම්මකට අනුව වුවත්, පැහැදිලි ලෙස ම ඩිමොක්‍රටික් පක්ෂය පිලිබඳ ෂිහාන්ගේ හෙලාදැකීම ගැන නිකොල්ස් සඳහන් නොකිරීම දේශපාලනිකව වංචනික නොවන්නේ ද? ඩිමොක්‍රටිකයන්ගෙන් පැහැදිලි ලෙස ම බිඳීමට ඇය ගත් තීරනය සාකච්ඡාවට ගැනීමට නේෂන් හි වාර්තාකරුට නොහැකි වී ඇත්තේ මන්ද?

පලමුව ඔහු ඇගේ දෘෂ්ටියට එකඟ නොවීම බව පැහැදිලි ය. "සින්ඩි ෂිහාන්ගේ සමුගැනීම" ලිපිය තුල නිකොල්ස් තම නොඑකඟතාවන් ගැන අතියම් ලෙස සඳහන් කරයි. "ඇගේ අදහස් හෙලිකරන අවංක ක්‍රීඩිකාවක් සමහර විට පමන ඉක්මවා ද බොහෝ විට අසම්පූර්නව ද සෑම විට ම අවංකව ද ඇගේ වචන ක්‍රියාවෙන් ඔප්පු කරන" බව ඔහු ඇයට සිහිපත් කරයි.

එම අනුග්‍රාහී හුස්මෙන් ම නිකොල්ස් ෂිහාන් " වචනාර්ථයෙන් ම ජෙෆර්සන්වාදී ඩිමොක්‍රටිකයෙක්" ලෙස හංවඩු ගසන අතර (ඔහු තමාගැන ම කියන්නේ කුමක්දැයි නිකොල්ස් අපට කිව යුතු ය.) "දේශපාලඥයන් ගැන ඇගේ තක්සේරුව හා දේශපාලනය ගැන ඇය කියවා ඇති තරම පිලිබඳව ෂිහාන් සමග වාද කිරීම සාධාරන ය. ව්‍යවස්ථාදායක උපායන් හා ප්‍රචාරක මූලෝපාය ගැන ඇය විශේෂඥවරියක් නොවන බව ඇය ප්‍රථමයෙන් ම පිලිගත යුතු ය" යි ඔහු කියා සිටී.

ඩිමොක්‍රටික් පක්ෂයෙන් ඉල්ලා අස්වීම පිලිබඳ ඇගේ "පමන ඉක්මවා ගිය" හා " අසම්පූර්න" ප්‍රකාශ අමතක කර දමා රැල්ලට යලි එක් වනු ඇතැයි නිකොල්ස් බලාපොරොත්තු වනවා විය හැක. ගනන් බැලීම් කුමක් වුවත් ඩිමොක්‍රටිකයන් ආරක්ෂා කිරීමට සහාය ගොනු කිරීමේ දී ඔහු දක්වන නොහැකියාව පෙන්නුම් කරන්නේ දේශපාලන ආත්ම විශ්වාසයේ අත්‍යසාමාන්‍ය බංකොලොත්කම යි. කෙසේ වුවද එය වටහා ගත හැකි ය. ප්‍රශ්නය සමග මාස ගනනක් සෙල්ලමේ යෙදීමෙන් පසුව කොන්ග්‍රස් ඩිමොක්‍රටිකයන්, ඉරාකයේ සාපරාධී ගැටුම පවත්වා ගෙන යාම සඳහා බුෂ්ට අවශ්‍ය අරමුදල් සපයා දීමට එකඟ වීම, දිය බෙත්මකි. ෂිහාන් නිශ්චිත නිගමනයන් උපුටා ගත් අතර ඒ ඇය පමනක් ද නොවේ.

## නේෂන්හි විශේෂත්වය හා නිකොල්ගේ ක්‍රියා කලාපය

ඩිමොක්‍රටික් නායකයන් "වමෙන්" විවේචනය කිරීමත් හොඳින් කටයුතු කරන ලෙස ඔවුන්ගෙන් ඉල්ලීමත්, ඔවුන්ගේ දක්ෂිනාංශික ගමන් මගේ ප්‍රතිවිපාක ගැන ඔවුන්ට අනතුරු ඇඟවීමත් නේෂන්හි විශේෂත්වය යි. කෙසේ වෙතත්, ඒ එකදු විවේචනයක් වත් මෙම මහා ව්‍යාපාරිකයන්ගේ පක්ෂයට සහාය දැක්වීමෙන් සඟරාව වලක්වන්නේ නැත.

නිකෝල් ක්‍රියාකාරී වන්නේ, විවිධ ඩිමොක්‍රටිකයන් ඔවුන්ගේ අතීත කාර්ය සාධනය නොතකා "යලි සොයාගත්" හා "යලි හැඩගැස්වූ" මිනිසුන් හා ගැහැනුන් ලෙස සැරසීමේ විශේෂ ක්ෂේත්‍රයෙහි ය. ඒ හෝ මේ කුලී දේශපාලඥයන් අතරින් ප්‍රගතිශීලී රූපකායන් සොයාගැනීම ඔහුගේ වැඩ කටයුතුවලට සම්බන්ධ ය.

ජෝන් කෙරීගේ 2004 අපේක්ෂකත්වය හා මැතිවරන ව්‍යාපාරයට අදාලව නිකොල්ස් ඉටු කල ක්‍රියා කලාපය සමහර විට වඩාත් ම කැපීපෙනෙන එකය. යුද විරෝධී මනෝගතීන් සමග බද්ධ වී ගත් හොවාර්ඩ් ඩීන්ගේ ඩිමොක්‍රටික් පක්ෂ ජනාධිපති අපේක්ෂකත්වය සඳහා වූ ව්‍යාපාරය පිටුපස ගාල්වීමෙන් පසු නිකොල්ස්, වඩාත්ම ගැලපෙන පුද්ගලයා ලෙස කෙරී නගා සිටුවීම තමන් වෙත පවරාගත්තේ ය. මෙම උත්සාහයේ ඉහලම තුඩ සලකුනු කලේ "කෙරීගේ අභියෝගය" නමින් 2004 මාර්තු 22 දින නේෂන්හි පලකල ලිපියයෙනි.

එම ලිපිය තුල නිකොල්ස් තර්ක කලේ " වෙනසට පත් සාමකාමියෙක්" ලෙස ව්‍යාපාරයට පිවිසුනු කෙරී ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ්ට "ශක්‍ය විකල්පයක්" බවට තමන්ව පත් කර ගත් "ආන්තික හැඩගැස්මකට" බඳුන් වී තිබෙන බවට ය. නිකොල්ස් විස්තර කලේ වෙලඳාම, ඉරාක යුද්ධය හා වෙනත් ප්‍රශ්න පිලිබඳව " යලි හැඩගැස්ම කුමන පෙරලියකට හසුව තිබේ ද" යනුවෙනි. ඉරාකයට එරෙහිව බලය පාවිච්චි කිරීමේ යෝජනාව ද, දේශප්‍රේමී පනත ද ගැන සඳහන් කරමින් තීරුරචකයා පැහැදිලි කලේ එම ප්‍රතිගාමී පියවර දෙකට ම පක්ෂව ඡන්දය දුන් කෙරී "මැතිවරන ව්‍යාපාරය තුල දී එම ආරම්භකත්වයන් සපා කෑමට ඉගෙනගෙන" ඇති බවයි.

සැබවින්ම 2004 මාර්තු මුල දී ඩිමොක්‍රටික් අපේක්ෂකයා තමා බවට කෙරීගේ සහතික වීමේ අර්ථය, කනස්සල්ලට පත්ව සිටි දේශපාලන හා මාධ්‍ය සංස්ථාපිතයට යම් තරමකට සහනයක් වූ තාක් දුරට, විවේචනයේ දී ප්‍රවේශම්සහගත වූ දූන් එකිනෙකාට මුහුන දී සිටි යුදවාදී අපේක්ෂකයන් දෙදෙනා

ජනාධිපතිවරන ව්‍යාපාරයෙන් ඉරාක යුද්ධය ඉවත් කර තැබීමට සමත් වී තිබීමයි.

කෙරී සඳහා වූ නිකොල්ස්ගේ මහජන සම්බන්ධීකරන කටයුතු 2004 පුරා ම දිගට ම සිදු විය. මෑත ඉතිහාසයේ වඩාත්ම දේශප්‍රේමී හා යුදවාදී වූ ඩිමොක්‍රටිකයන් ජූලි මාසයේ පැවැත්වූ ජාතික සමුලුවෙන් පසුව "සටන්කාමී කෙරී" ලෙස සිරස්තලය නිකෝල්ගේ ප්‍රකාශය තුල අවධාරනය කලේ අපේක්ෂකයා "කටයුතු අවසාන කලේ ජනාධිපතිට ඔබින පරිදි දුන් ආක්‍රමනකාරී මුෂ්ටි ප්‍රහාරයකිනි" යනුවෙනි. සැබැවින්ම කෙරීගේ මුලු ව්‍යාපාරය ම ජනතාව පුබුදුවා ගැනීමට ඓන්ද්‍රියව අසමත් වූයේ බොහෝකොට ම රිපබ්ලිකානු දක්ෂිනාංශික න්‍යාය පත්‍රය සමග සහයෝගීව කටයුතු කිරීම නිසාවෙනි.

දේශපාලනය ක්‍රීඩාවක් නොවේ. මිනිසුන් කියන හා කරන දේහි ප්‍රතිවිපාකයන් තිබේ. පොදුවේ වාමාංශික නැඹුරුවක් දක්වන හා දේශපාලන මග පෙන්වීමක් බලාපොරොත්තුවන පාඨකයන් දහස් ගනනක් නේෂන් කියවන බව අනුමාන කල හැකි ය. කෙරීගේ මැතිවරන ව්‍යාපාරයට සහාය දීම මගින් නිකොල්ස් කලේ මහජන මතයට ක්ලෝරෆෝම් ඇල්ලීම ය.

2006 මධ්‍යවාර මැතිවරනය ආසන්නව නිකොල්ස් "පෙර මහතා සහ පසු මහතා" යන ලිපියෙහි එම ප්‍රවිෂ්ටයම යොදාගත්තේ ය. මැතිවරන ව්‍යාපාරය අවධියේ දී "උග්‍ර ප්‍රශ්න මගහැරීමට දැඩි වෙහෙසක් දැරීම" පිලිබඳව ඩිමොක්‍රටිකයන් විවේචනය කල ඔහු, එනමුදු දීප්තිමත් අනාගතයක් පිලිබඳව බලාපොරොත්තු දැල්වීය.

"විරුද්ධ පක්ෂය තුල ඇතිව තිබෙන වෙනසෙන් මම කුල්මත්ව සිටිමි. එය සිදු වුවහොත් ඉතා වෙනස්, මන බඳිනා කොන්ග්‍රසයක් අපට හිමි වනු ඇත. තේරී පත්වීමට බොහෝ ඉඩකඩ ඇති, හා අප වොෂින්ටනයට යන්නේ මෙම යුද්ධය සම්බන්ධයෙන් යමක් කිරීමට බව සිය ඡන්ද දායකයන්ට පවසා ඇති, මිනිසුන් සිටිති. එය සිදු වුවහොත් මම සිතන්නේ එය වඩාත් සෝෂාකාරී කොන්ග්‍රසයක් වනු ඇති බවත් බොහෝ පැතිවලින් සමූහාන්ඩුවේ නිර්මාතෘන් බලාපොරොත්තු වූ තැනට යලිත් ගමන් කරනු ඇති කොන්ග්‍රසයක් හා පවතින කොන්ග්‍රසයෙන් සිදුවී නැති ආකාරයේ විධායක අංශය හසුරුවා ගන්නා ආයතනයක් බවට එය පත්වනු ඇති බවත්"යයි ඔහු සම්මුඛ සාකච්ඡාකරුවකුට පැවසී ය.

කොතරම් මොට්ට හා පොට්ට ප්‍රකාශයක් ද? සඟරාව තුල හා ඒ වටා යම් සමාජ හෘද සාක්ෂ්‍යයක් සහිතව සුවපහසුව රැඳී සිටින වෘත්තීයවේදී කවයන් තමන් කල්ලිවාදී නොවීම ගැන උඩඟුවනු ඇත. "ප්‍රායෝගික මිනිසුන්" හා "දේශපාලන යථාර්ථවාදීන්" නම් මොවුන් ය. සැබැවින් ම, සංස්ථාපිතයේ එක කොටසක් තුල හිඳිමින් ඔවුන් කතා කරන පරිද්දෙන් හෙලිවන්නේ ජනගහනයේ මනෝභාවයෙන් ඔවුන් කොතාක් හුදෙකලා වී සිටී ද යන්නය.

"දේශපාලඥයන් ගැන ඇගේ තක්සේරුව හා දේශපාලන දැනුම" පිලිබඳව ෂිහාන්ට බැනවදින නමුත් ඔහුගේම ප්‍රඥාව ගැන කෙසේ ද? ඔහුගේ මෙම ශක්‍යතාවෙන් යුත් "වඩාත් මන බඳින කොන්ග්‍රසය" පෙරලී ඇත්තේ කුමක් බවට ද?

මෙම වසරේ ජූනි 7 දින, ඇමරිකානු ජනතාව පක්ෂ දෙකම පිලිකුල් කරන බවට සලකුනු දිස්වන්නේ යයි පිලිගැනීමට ඔහුට බල කෙරුනි. "අවාසනාවකට ඩිමොක්‍රටිකයන්ට ඡන්දය දුන් අය ජෝර්ජ් බුෂ්ට වඩා හොඳින් කටයුතු කරනු ඇතැයි විරුද්ධ පක්ෂය කෙරේ තැබූ විශ්වාසය පලුදු වී යාමේ ක්‍රියාවලියකට ලක්ව තිබේ." යයි ඔහු සඳහන් කරයි. සත්තකින්ම, මත විමසුමකට අනුව කොන්ග්‍රස් ක්‍රියා කලාපය කෙරෙහි අනුමැතිය පලකලේ ජනතාවගෙන් සියයට 23ක් පමනි.

අනුමැතියේ මෙම පහත් අනුපාතය හුදෙක් පසුගිය මාස කිහිපයේ සිදුවූ දෙයක් නොවේ. ඉමහත් සැක සංකා හා අවිශ්වාසයෙන් යුතුව, බුෂ් හා යුද්ධය කෙරෙහි වෛරය හේතුකොට ගෙන ජනතාවගේ විශාල සංඛ්‍යාවක් 2006 නොවැම්බරයේදී සිය නාස් වසාගෙන ඩිමොක්‍රටිකයන්ට ඡන්දය දුන්හ. ඔවුන් පලකල භීතිය දැන් උත්සන්නව ඇත.

නිකොල්ස් සහ සමාගම ඔවුන් ලියන දේ විශ්වාස කරනතාක් දුරට, ඇමරිකානු සමාජ යථාර්ථයෙන් ඔවුන් කොතෙක් දුරස්ත වී ඇත් දැයි කිවහොත් ඔවුන්ගේ ම "ලිබරල් කට්ටිවාදයේ" හංවඩුව වැදී පීඩාවට පත් වෙති.

## ඩිමොක්‍රටිකයන් වෙනුවෙන් නිකොල්ස් මැදහත්කරු වෙයි

නිකොල්ස්, ඔහේ හුදෙක් බලා සිටින්නෙක් නො වේ. ඩිමොක්‍රටිකයන් 2007 දී කොන්ග්‍රසයේ පාලනය ලබා ගැනීමෙන් සති කිහිපයක් ගතවීමටත් මත්තෙන් එහි ඊනියා ප්‍රගතිශීලී කන්ඩායම විසින් රැස්වීමක්, නේෂන් හා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සම සහභාගිත්වයෙන් පැවැත් වූ අතර නිකොල්ස් එහි මැදහත්කරු ලෙස කටයුතු කලේ ය. සඟරාවේ කර්තෘ හා ප්‍රකාශක වන කැට්රිනා වැන්ඩන් හියුවල් සඳහන් කලේ රිපබ්ලිකන් පාලනය යටතේ සාමාජිකයන් 69කින් යුත් ලිබරල් ඩිමොක්‍රටික් කන්ඩායම, "කොන්ග්‍රසයේ විශාලතම කන්ඩායම"ට රැස්වීමට බලකෙරී තිබුනේ ගොඩනැගිල්ලේ යටි බිම්මහලෙහි ය. එහෙත් දැන් එම කන්ඩායම රේබර්න් හවුස් කාර්යාල ගොඩනැගිල්ලෙහි රැස්වෙයි. සැබවින්ම මේ දේවල් ඇස් අරවන සුලු ය.

නිකොල්ස් මැදහත්කරුවා ලෙස කටයුතු කල රැස්වීමට පැමින සිටියවුන් අතර ඩිමොක්‍රටික් පක්ෂයේ

බලවතුන් වන චාර්ල්ස් රැන්ගල්, බාර්නි ෆ්රැන්ක්,මැක්සින් වෝටර්ස්, ජෝන් කොන්යර්ස්, ඩෙනිස් කුසිනිච් හා තවත් අය වූහ. එහිදී ලොකු රඟපෑමක් ද සිදුවිය.

"ශාලාව ජීව ගුනයෙන් ද දෘෂ්ටිවාදයෙන්(!) ද පිරිපුන් විය. එය පිලිබිඹු කලේ ඩිමොක්‍රටික් පක්ෂය ජනතා ව්‍යාපාරය පසෙකින් වැඩ කර තිබුන තත්වය තුල පක්ෂයේ හොඳම පැය කිහිපය ලඟා වී තිබෙන්නේ ය යන කන්ඩායමේ අවබෝධයයි. ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන්නේ පුරවැසියන් එය තමන්ගේ ම දෙයක් යයි කියා සිටීමට තරම් ආවේශය ලැබීමෙනි. අප සියල්ලන්ගේ මුහුනුවල සිනහව තිබිය යුතු යයි කියා සිටි කන්ඩායමේ සාමාජිකයෙක් රැස්ව සිටියවුන්ගේ හඬ අවදි කලේ ය. අප රටේ ගමන් මාවත වෙනස් කරමින් පසුගිය මැතිවරන ජයග්‍රහනය කිරීමට උදව් වූ අප සමීපතම ආත්මයන් ය. එය නව මගක් සඳහා වූ අලුත් දිනයකි" යනුවෙන් වැන්ඩල් හියුවල් එය නිරීක්ෂනය කලේ ය.

සිහින ලෝකයේ ද, ස්වයංමුලාවේ ද, දූනුවත්ව රැවටීමේ ද නිවැරදි පරිමාව මෙම ප්‍රකාශයෙන් වටහාගැනීම අපහසු නොවේ.

2008 ප්‍රාථමික වටයේ පූර්ව කටයුතුවල දූනටමත් නිකොල්ස් වෙහෙස නොබලා යෙදී සිටියි. ඔහු ඩිමොක්‍රටික් අපේක්ෂකත්වය බලාපොරොත්තුවන බැරැක් ඔබාමා, බිල් රිචඩ්සන් වැන්නවුන්ට උපදෙස් දෙමින් ද අවශ්‍ය වුවහොත් අනෙකුන්ගේ ද ප්‍රතිරූපයන් ඔජ නංවමින් හා පුම්බමින් ද සිටියි.

පැහැදිලිව ම ඔහුගේ විකල්පයන් විවෘතව තබාගන්නා අතර ම නිකොල්ස්, වඩාත්ම සහයෝගය දක්වන බව පෙනීයන්නේ උතුරු කැරොලිනාවේ හිටපු සෙනෙට් සභික ජෝන් එඩ්වර්ඩ්ට ය. (නේෂන්හි කාර්ය මන්ඩලය පොදුවේ නිව් යෝර්ක් සෙනේට් සභික හිලරි ක්ලින්ටන්ට කැමැත්තක් නොදක්වන නමුදු ඇය අපේක්ෂකත්වය දිනා ගත හොත් ඔවුන් ඇගේ කරත්තයට පැනගනු ඇත.)

මෑත ලිපියකින් නිකොල්ස් ඔහුට සුපුරුදු විලාසයෙන් එඩ්වඩ්ස්ගේ 2004 මැතිවරන කාලයේ " ගම්බද ඇමරිකාවේ නරක කාලය පිලිබඳව කතා කරන පිලිකුල් සහගත සැලැස්ම" ගැන එඩ්වඩ්ස්ට දොස් පැවරුව ද, ඩිමොක්‍රටික් පක්ෂ උප ජනාධිපති අපේක්ෂකයාගේ නව ප්‍රවිෂ්ටය පිලිබඳව ප්‍රශංසා කරයි. "මෙම වසරේදී එඩ්වඩ්ස් හොඳින් කටයුතු කර තිබේ." නේෂන් තීරු රචකයා සිය පාඨකයන්ට එසේ පවසයි. එඩ්වඩ්ස්ගේ නව සැලැස්මෙන් "2008 ඩිමොක්‍රටික් නාම යෝජනා බලාපොරොත්තුවන අපේක්ෂකයා 2003 ඔහුගේ සැලැස්මෙන් වාසි සැලසීමට ඉඩතිබූ මහා කෘෂි ව්‍යාපාරික අවශ්‍යතාවන්ට වඩා වැඩ කරන ගොවීන් සමග පෙල ගැසෙයි. අපේක්ෂකයා හා ඔහුගේ ආධාරකරුවන් 2003 පටන් බොහෝ දේ ඉගෙනගෙන තිබේ." තව දුරටත් ඔහු එසේ ඉදිරියට යයි.

**මතු සම්බන්ධයි.**

© www.wsws.org